# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

## සිංහල භාෂාව හා සාහිත්‍යය සංග්‍රහය

විභාග අංකය:....................................  නම:....................................................

| 10 ශ්‍රේණිය | III පත්‍රය | කාලය පැය 02යි. |
|---|---|---|

<u>සැලකිය යුතුයි</u>

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න <u>පහකට පමණක්</u> පිළිතුරු ලියන්න.**
- **1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් <u>එකකටත්</u> පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල ජාතක කතාවක ආකෘතියට අයත් අංග දෙකක් ලියන්න.

(ii) පහත සඳහන් කවියෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

...................................................................................

...................................................................................

නන්දන කැන් දුටුවද බිය  සිස් වූ

මින් රළවුත් ගං වෙරළට  රුස් වූ

(iii) "ඈ එතරම් මහලු ය. කැලෑ ජීවිතයෙහි ලකුණු ඇගේ ශරීරයෙහි ඇඳී තිබුණේ ය."

(අ) මෙහි සඳහන් ඈ කවුරුන් ද?

(ආ) එම චරිතය හමුවන පාඩම කුමක් ද?

(iv) "දේවයෙනි, මහත් වූ කෝලහාල ශබ්දයෙක, අපි කුමක් බවත් නො දනුම්හ...."

(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන් ද?

(ආ) එසේ ප්‍රකාශ කරන්නේ කා හට ද?

(v) "දෙදෙනම ඉඳ දෙපිට - සව්සත සතන් තුටු කොට"

(අ) දෙපැත්තෙහි ඉඳගෙන සිටි දෙදෙනා කවුරුන් ද?

(ආ) 'සව් සත' යන්නෙහි අර්ථය ලියන්න.

(vi) (අ) සිංහල ජන ජීවිතය ගැන ඉංග්‍රීසි බසින් නවකතාවක් (විලේජ් ඉන් ද ජංගල්) ලියූ කතුවරයා කවුරුන් ද?

(ආ) එය සිංහලයට අනුවර්තනය කළ ගත් කතුවරයා නම් කරන්න.

(vii) කෝට්ටේ යුගයේ රචනා වූ පද්‍ය කෘතීන් දෙකක් ලියන්න. (ගුත්තිල කාව්‍ය හැර)

(viii) කේවට්ට බමුණාගේ සහ මහෞෂධ පඬිතුමාගේ චරිත ලක්ෂණ දෙකක් ලියන්න.

(ඔබට නියමිත කොටස ඇසුරින්)

(ix) (අ) "අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දනේ"

(ආ) "විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙළා"

ඉහත උපදේශ ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

(x) රැකියාවන් (වෘත්තීන්) ආශ්‍රිතව නිර්මාණය වූ ජන කවි වර්ග දෙකක් ලියන්න.

(ලකුණු 2×10 = 20යි.)

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "තමන් වහන්සේ හා එක දවස උපන් යෝධයන් දහස හා සිවුරඟ සෙනඟ හා පිරිවරා, අනූ දහසක් රන් වටනා **<u>හැළි අසුන්</u>** යොදන ලද, **<u>සර්වාලංකාරයෙන්</u>** සැරහූ රථයකට පැන නැඟී, දවල් මේ නිමවන වේලාවට වාසල සමීපයට පැමිණි සේක."

(අ) මෙය කුමන අවස්ථාවක් හා සම්බන්ධ වේද?

(ආ) 'හැළි අසුන්' , 'සර්වාලංකාර' යන පදවල අර්ථ දක්වන්න.

(ii) "ජනාකීර්ණ සමහර ගම් මැදින් බියපත් සිවල් දෙනක මෙන් බියෙන් ඇලළී ඇකිළී යන විට ඇගේ මේ තනිකම ඇට දනුනේ වඩාත් බලවත් ලෙසිනි."

(අ) ඉහත ප්‍රකාශයට අනුව පුංචිමැණිකා බිය වන්නේ කුමක් නිසා ද?

(ආ) මෙහි සඳහන් වන අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

(iii)
**<u>කන්කලු</u>** වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දල් කොලහල වන බියෙනේ
සත් සල නොව එහි පිළි රූ ලෙසිනේ
**<u>නන් හය සෙන්</u>** සිටියෝ සිටි මතිනේ

(අ) මෙහි අදහස ඔබේ වචනයෙන් ලියන්න.

(ආ) මෙහි ඉරිඇඳි පදවල අර්ථ ලියන්න.

(iv)
ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනූ
**<u>බොරැල්ලේ</u>** තරම දැනගෙන උඩ පනිනූ
කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනූ
තමුන්ගේ තරම දැනගෙන කල් හරිනූ

(අ) මෙම පද්‍යයෙන් ලබාදෙන උපදේශයක් ලියන්න.

(ආ) ඉරිඇඳි පදයට අර්ථ සපයා විධානාර්ථයේ පදයක් ලියන්න.

(v)
සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

(අ) මෙම පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.

(ආ) මෙහි සඳහන්වන 'නොසතුටට' හේතුව කුමක්ද?

(ලකුණු 4×5=20)

- 3 හා 4 ප්‍රශ්න අනිවාර්ය වන අතර 5,6,7 ප්‍රශ්නවලින් **<u>එකකට පමණක්</u>** පිළිතුරු ලියන්න.

3. ජාතක කතා කරුවා, 'සතර කන් මන්ත්‍රණය' පාඩම තුළින් පාඨක සිතේ සංකල්ප රූප මවමින්,

- කේවට්ට බමුණු චරිතය හාස්‍යයෙන් හා උපහාසයෙන් ද
- මහෞෂධ චරිතය දුර දක්නා නුවණින් කටයුතු සිදු කිරීමත්,

යන අංශවලින් මතු කරන ආකාරය උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

**<u>නැතහොත්</u>**

පොදු ජනයා අතර භාවිත සිංහල ජන කවිය, ජීවිතය රසවත් හා අර්ථවත් කිරීමට

- සරල අව්‍යාජ භාෂා භාවිතයත්
- උපදෙස් ලබා දීමත්, කෙරෙහි අවධානය යොමුකර ඇති ආකාරය "හානා හීය පානා අඬ හැරෙන් දනේ" පද්‍ය නිර්මාණය ඇසුරෙන් උදාහරණ දෙක බැගින් ගෙන විචාරයට ලක් කරන්න.

(ලකුණු 15යි)

4. වැත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවීත්වය, ගුත්තිලයේ වීණා වාදනයේ මිහිරියාව ධ්වනිතාර්ථවත් (ඉස්මතු කිරීම) කිරීමට,

- අවට රැස් වූවන්ගේ ස්වභාවයත්,
- උචිත අලංකාර භාවිතයත්,

හේතු වූ බව උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

**<u>නැතහොත්</u>**

බැද්දේගම හා එහි වැසියන් ක්‍රමයෙන් අභාවයට යන ආකාරය සජීවී ලෙස නිරූපණය කරන්නට කතුවරයා,

- භාෂාව භාවිත කර ඇති ආකාරයත්,
- චරිත යොදාගෙන ඇති ආකාරයත්,

උදාහරණ දෙක බැගින් ගෙන විස්තර කරන්න.

(ලකුණු 15යි)

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.

5. පරිසර අත්දැකීම් උපයෝගී කොට ගෙන උපදෙස් ලබා දීමට ජන කවියා සමත් වී ඇති ආකාරය 'හානා හීය පානා අඬ හැරෙන් දූනේ' පද්‍ය පන්තිය ඇසුරෙන් නිදසුන් තුනක්වත් දක්වමින් විචාරයට ලක් කරන්න.

(ලකුණු 10 යි)

6. 'සුරඟන රැඟුම' මනහර සංකල්ප රූපී නිරූපණයක් කිරීමට වැත්තෑවේ හිමියන්ට හැකි වූයේ උන් වහන්සේ සතු කාව්‍ය ප්‍රතිභාව නිසා ය.' උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

7. මහෞෂධ පණ්ඩිතයන්ගේ උපාය කෞශල්‍යය හේතුවෙන් වේදේහ රාජ්‍යය ආරක්ෂා වූ ආකාරය උදාහරණ අවස්ථා තුනක් ගෙන විස්තර කරන්න.

(ලකුණු 10 යි)